ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

---

# 1990 අංක 28 දරන

# පලාත් සභා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1990 ජූලි මස 6 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1990 ජූලි මස 06 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

මිල : ශත 45 යි.

තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 ජූනි මස 6 වන දින]

එල්. ඩී.—ඕ. 20/89.

1987 අංක 42 දරන පළාත් සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1987 අංක 42 දරන පනතේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින්මතු " ප්‍රධාන ප්‍රඥප්තිය " යනුවෙන් සඳහන් කරනු ලබන) 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 25 වන වගන්තියේ (1) වන උපවගන්තියේ " [redacted]

ප්‍රධාන ප්‍රඥප්තියට 27 අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

3. 27 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 27අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

" ආණ්ඩුකාරවරයා ගේ බලතල.

27අ. මුදල් වර්ෂය සඳහා වාර්ෂික මුදල් ප්‍රකාශය අනුමත කරනු ලැබීමට පෙර පළාත් සභාවක් විසුරුවා හරිනු ලැබ හෝ වෙනත් යම් හේතුවක් නිසා පළාත් සභාවක කටයුතු කරගෙන යාම හානි වී ඇති හෝ අඩාල වී ඇති, මේ කොටසේ ඉහත සඳහන් විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද, ආණ්ඩුකාරවරයා විසින්, අලුත් පළාත් සභාව රැස්වීම පිණිස කැඳවනු ලැබ ඇති දිනයෙහි හෝ පළාත් සභාව කටයුතු කිරීම නැවත ආරම්භ කරන දිනයෙහි හෝ සිට මාස තුනක කාලසීමාවක් ඉකුත් වනතුරු, එම පළාතේ පාලනය සඳහා ඔහු අවශ්‍ය යයි සලකනු ලබන අරමුදල්, පළාත් සභා අරමුදලින් නිකුත් කිරීමට සහ ඒ අරමුදල් වියදම් කිරීමට අවසර දෙනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (2අ) යම් පළාතක පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්, ඒ පළාතේ ආණ්ඩුකාරවරයා විසින් නියම කරනු ලබන යම් කොන්දේසිවලට යටත්ව, පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධරයන්ගේ පත්වීම්, මාරුවීම්, සේවයෙන් පහකිරීම් සහ විනය පාලනය පිළිබඳ බලතල ඒ පළාතේ පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රධාන ලේකම්වරයා වෙත හෝ යම් නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

2—ඩී 000182—6,860 (90/06)

(2අ) ඉහතින් වූ උපවගන්තිය යටතේ යම් පළාතක පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්, එහි බලතල පවරා ඇත්තා වූ ඒ පළාතේ පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රධාන ලේකම් වරයා විසින් හෝ යම් නිලධරයකු විසින් කරනු ලද යම් නියමය නිසා අතෘප්තියට පත් ඒ පළාතේ පළාත් සභා රාජ්‍ය සේවයේ යම් නිලධරයකුට, ඒ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කිරීමේ අයිතිය ඇත්තේ ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියේ (8) වන උපවගන්තියේ "පළාතක පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්" යන වචන වෙනුවට "පළාතක පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් යම් අභියාචනයක් මත හෝ අන්‍යාකාරයකින් හෝ, 33 වන වගන්තිය යටතේ යම් පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් විසින් එහි බලතල පවරා ඇත්තා වූ ඒ පළාතේ පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රධාන ලේකම්වරයා හෝ යම් නිලධරයකු විසින්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ "පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ එහි යම් සාමාජිකයකුගේ හෝ යම් තීරණයකට" යන වචන වෙනුවට "පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ එහි යම් සාමාජිකයකුගේ හෝ එවැනි යම් පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් විසින් පවරන ලද බලතල කිසිවක් ක්‍රියාත්මක කරන පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රධාන ලේකම්වරයකුගේ හෝ යම් නිලධරයකුගේ හෝ යම් තීරණයකට " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇතිවුව හොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

7. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.